# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

| | | |
|---|---|---|
| **නාට්‍ය හා රංග කලාව** | **8 ශ්‍රේණිය** | කාලය පැය දෙකයි |

### I කොටස

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

**1.** කථාවක් හෝ සිදුවීමක් නාට්‍යයක් බවට පත් කිරීමේදී සැලකිය යුතු කරුණක් **නොවන්නේ**
   i. කථාවේ දක්නට ලැබෙන මුල, මැද, අග, ඒ පිළිවෙලට ම නාට්‍යයේ ඇතුළත් කිරීම අනිවාර්ය වේ
   ii. කථාවේ සිද්ධි මාලාවේ ඒ අනුපිළිවෙලින්ම ඇතුළත් නො කර කථා තේමාව මතු කළ හැකි ආකාරයට වෙනත් පිළිවෙලකින් වුව ද නාට්‍යයට ඇතුළත් කිරීම
   iii. කථාවේ දක්වෙන අදාළ සිද්ධි හා අවස්ථා නාට්‍යයට උචිත පරිදි සකස් කිරීම
   iv. කථාවේ මූලික හරයට හානි නොවන පරිදි නාට්‍ය වස්තුව ගොඩ නැගීම

**2.** නාට්‍යයකට සුදුසු කථාවක තිබිය යුතු ලක්ෂණයක් **වන්නේ**
   i. ගැටුම් අවස්ථා නොතිබීම
   ii. කුතුහලය මතු නොවීම
   iii. කිසියම් අරමුණක් පෙර දැරි කරගෙන කථාව විකාශය වීම
   iv. විශ්වාසනීය ව ඉදිරිපත් නොකිරීම

**3.** අභිනය යනු කුමක්ද?
   i. අංගචලන භාවිතය යි
   ii. නාට්‍යයක් නළුවන් ඉදිරියේ රඟ දැක්වීම යි
   iii. නාට්‍යයක් අභ්‍යන්තරව ඉදිරිපත් කිරීම යි
   iv. නාට්‍යයක් ප්‍රේක්ෂකයා ඉදිරියේ ඉදිරිපත් කිරීම යි

**4.** වේෂභූෂණ නිර්මාණයේ දී
   i. චරිතයෙහි ස්වභාවය පිළිබඳව සලකා බැලිය යුතුය
   ii. අනවශ්‍ය ආභරණ පැළඳීම වැදගත් ය
   iii. සැහැල්ලු රෙදි භාවිතා නොකිරීම
   iv. සංකීර්ණ රටා සහිත රෙදි භාවිතා කිරීම

**5.** "කුමට ද සොබනියෙ කඳුළු සලන්නේ" යන ගීතය
   i. කඳා වළලු නාට්‍යයේ ය
   ii. නරිබෑණා නාට්‍යයේ ය
   iii. දික්තල කාලගෝල නාට්‍යයේ ය
   iv. මනමේ නාට්‍යයේ ය

- **6 සිට 10 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා හිස් තැන් මත ලියන්න.**

**6.** නාට්‍ය පෙළක් රචනා කිරීමේදී ............................. සිදුවිය යුතුය.

**7.** නළු නිළියන් තෝරා ගැනීම ............................. නමින් හැඳින්වේ.

**8.** ප්‍රධාන චරිත හැරුණු විට සෙසු චරිත ද ............................. වැදගත් වේ.

**9.** යම්කිසි ගැටුම්කාරී ස්වභාවයක් ............................. අවස්ථාවක් ලෙස හැඳින්වේ.

**10.** ශිථිලකරණ අභ්‍යාසවලින් ............................. ශරීරයක් ලබා ගත හැකිය.

**(නම්‍යශීලී/ රූපණයේ දී/ චරිත ගැලපීම/ නාට්‍යෝචිත/ නළුවරණය)**

- **යා කරන්න.**

| A | B |
|---|---|
| **11.** දුල් ගීයකි | • තොප්පි වෙළෙන්ද |
| **12.** නාට්‍ය ගීතයකි | • ස්වසන අභ්‍යාස |
| **13.** ළමා නාට්‍යයකි | • ඒ ආලේ හෙලෙයි ලෝ |
| **14.** රංග අභ්‍යාසයකි | • බුද්ධ ගජ්ජය |
| **15.** හඬ අභ්‍යාස සඳහා යොදා ගනී | • විභාගේ විභාගේ |

- **කෙටි පිළිතුරු සපයන්න.**

**16.** අනුෂාංගික අංගයක් නම් කරන්න.

..............................................................................................................................

**17.** වාචික අභිනය යනු කුමක්ද?

..............................................................................................................................

..............................................................................................................................

**18.** ජාතක කතාවක් ආශ්‍රයෙන් නිර්මාණය වූ නාට්‍යයක් ලියන්න.

..............................................................................................................................

**19.** ජන ගී වර්ග 2ක් ලියන්න.

..............................................................................................................................

..............................................................................................................................

**20.** "අමර ගියා දිව්‍ය ලෝකේ" නාට්‍ය කාගේ නිර්මාණයක් ද?

..............................................................................................................................

## II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.

01. පිළිතුරු සපයන්න.

1. ළමා නාට්‍යයක් යනු කුමක්ද?
2. ළමා නාට්‍ය 2ක් නම් කරන්න.
3. ළමා නාට්‍යකරුවන් දෙදෙනෙක් නම් කරන්න.
4. එම නාට්‍යකරුවන්ගේ ළමා නාට්‍ය නිර්මාණය බැගින් ලියන්න.
5. ළමා නාට්‍යයක් සතු ලක්ෂණ 2 ක් ලියන්න.

(ලකුණු 2x5=10)

02.

1. සතර අභිනය නම් කරන්න. (ලකුණු 2)
2. සතර අභිනය විස්තර කරන්න. (ලකුණු 8)

03.

1. වේෂ භූෂණ යනු කුමක්ද? (ලකුණු 2)
2. වේෂ භූෂණ නිර්මාණයේදී සැලකිය යුතු කරුණු 2 ක් නම් කරන්න. (ලකුණු 4)
3. රජ බිසවකට ගැළපෙන වේෂ භූෂණ නිර්මාණය කරන්න. (ලකුණු 4)

04.

1. රංග අභ්‍යාස යනු කුමක්ද? (ලකුණු 2)
2. රංග අභ්‍යාස 2 ක් ලියන්න. (ලකුණු 4)
3. රංග අභ්‍යාස කිරීමේදී ඇති ප්‍රයෝජන 2 ක් ලියන්න. (ලකුණු 4)

05. ජාතක කථාවක්, ජන කතාවක්, ඓතිහාසික කථාවක් හෝ ඔබ කැමති කතන්දරයක් ඇසුරු කර ගනිමින් සංවාද, චරිත, දෙබස්, ගැටුම්, අවස්ථා, රංග විධාන නාට්‍යෝචිත අවස්ථා සහිත නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්න.

(ලකුණු 10)